# දියුණු වෙමින් පවත්නා රටවල සංවර්ධනයෙහි උපාය මාර්ගයක් ලෙස සංචාරක ව්‍යාපාරය

හේරත් මාදන බණ්ඩාර

## හැඳින්වීම

පසුගිය අවුරුදු 50 ක පමණ කාලය තුළ ම දියුණුවෙමින් පවත්නා බොහෝ රටවල් සංචාරක ව්‍යාපාරය සලකනු ලබන්නේ එම රටවල සියලු ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට සොයාගන්නා ලද සර්ව රෝග නාශකයක් (Panacea) ලෙසයි (Cater, 1987). මෙම රටවල් ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය මෙසේ පහසු ආර්ථික සංවර්ධන උපක්‍රමයක් ලෙස සැලකීමට හේතුව එය මෙම රටවලට අත්‍යවශ්‍ය විදේශ විනිමය උපයන, රැකියා හා ආදායම් උත්පාදනය කරනු ලබන, රජයේ ආදායම් ඉහළ නංවන සහ ප්‍රාදේශීය සංවර්ධනයට අනුබල දෙන්නක් වන නිසයි. මේ නිසා බොහෝ සංවර්ධනය වෙමින් පවත්නා රටවල රාජ්‍යයන් සංචාරක කටයුතු පදනම් කරගත් සංවර්ධනය ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිවලට ඇතුලත් කර ඇත. එසේ වුවත් මෙම රටවල් සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ භුක්ති විඳින අතර ම ආර්ථික, සමාජ හා සංස්කෘතික හා පාරිසරාත්මක වශයෙන් අහිතකර බලපෑම් ද අත්විඳිමින් සිටී. මේ හැර ජාත්‍යන්තර දේශපාලන ආර්ථික ව්‍යුහයේ ස්වභාවය මගින් පැනවෙන සම්බාධකවලට අනිවාර්යයෙන් ම මුහුණ දීමට ඇති බැවින් ද දේශීය දේශපාලන අස්ථාවරත්වය නිසා ද බලාපොරොත්තු වන පරිදි සංචාරක ව්‍යාපාරයේ මහාඵල භුක්ති විඳීමට ඇති හැකියාව සීමිත වී ඇත. මේ ලිපියෙහි අරමුණ සංචාරක ව්‍යාපාරය දියුණු වෙමින් පවත්නා රටවලට සර්ව රෝග නාශකයක් වන්නේද? යන්න විමසීමයි. මෙහි දී සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා මේ රටවල් දැඩි උනන්දුවක් දැක්වීමට හේතු සොයා බැලීමත් ඒ සඳහා ඇති සම්බාධක පරීක්ෂා කිරීමත් සිදු කෙරේ. මෙම ලිපියෙහි තොරතුරු පූර්ව පර්යේෂණ මත පදනම් වී ඇත.

## දියුණු වෙමින් පවත්නා රටවල් සංචාරක ව්‍යාපාරයට මැදිහත්වීමට හේතු

ඓතිහාසික වශයෙන් සලකා බලන විට සංචාරක ව්‍යාපාරය වේගවත්ව වර්ධනය වන ආර්ථික ක්‍රියාවලියකි (Jenkins, 1997). දෙවන ලෝක සංග්‍රාමයට පසුව ශිල්ප ක්‍රමවල ඇති වූ දියුණුව, දියුණු රටවල ජනතාවගේ වියදම් කළ හැකි ආදායමේ සහ විවේකය ගත කරන කාලයේ ඇති වූ වැඩිවීම සහ ප්‍රවාහන සහ සන්නිවේදන මාධ්‍යයන් ලොව පුරා සංවර්ධනය වී ව්‍යාප්ත වීම හේතුවෙන් ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය විශාල පරිමාණයෙන් ආරම්භ විය. උදාහරණ වශයෙන් 1950 දී මිලියන 25 ක් පමණ වූ ජාත්‍යන්තර සංචාරකයින් සංඛ්‍යාව අවුරුදු 45 කට පසුව එනම් 1995 දී විසි ගුණයකින් වැඩි වෙමින් මිලියන 567 ක් විය. 2010 වසර වන විට මෙය මිලියන 937 ක් වේයැයි ගණන් බලා ඇත (WTO, 1997). මේ ආකාරයට බලන විට ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය ලෝකයේ ප්‍රධාන කර්මාන්තය බවට පත්වෙමින් පවතී. ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය ලෝකයේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය මෙන් දෙගුණයකටත් වඩා වර්ධන වේගයක් පෙන්වයි. මෙය ලෝකයේ විශාලතම කර්මාන්තය ලෙස සැලකෙනවා